# 9 එකට එක

මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා විසින් පළ කරන ලද "සිතුවම් සහිත දෙමළ ජනකතා" පොතෙන් උපුටා ගත් ජනකතාවක් මේ පාඩමට ඇතුළත් වේ.

මේ කතාවෙන් කියැවෙන්නේ මොහොමඩ් නැමති ධනවත් පුද්ගලයෙකු සහ කුඹල්කරුවෙකු අතර ඇතිවන ගැටලුවක් පිළිබඳව ය.

එකමත් එක කාලෙක එක කුඹල්කාරයෙක් තමුන්ගේ පුතාට මංගල්‍යයක් ජෝඩු කළා. මංගල්ලෙ දවසෙ රෑ අලුත් ජෝඩුව ඇතෙක් පිට නංවලා පෙරහැරේ ගෙනියන්ටත් කුඹල්කාරයාට ඕනෑ වුණා. ආගමේ චාරිත්‍රවාරිත්‍ර ඉවර වුණාට පස්සෙ කොට්ටුමේලම් සංගීතය මැද්දේ අලුත් ජෝඩුව පෙරහැරකින් අරන් යන එක දකුණු ඉන්දියාවේ සිරිතක්. හැබැයි අලි ඇත්තු යන්නෙ සල්ලිය බාගෙ තියෙන මිනිස්සු පවත්වන එහෙමත් පෙරහැරක විතරයි.

ඒ නුවර හිටියා මොහොමඩ් කියලා  අලි ඇත්තු අයිතිකාරයෙක්. කුඹල් කාරයා මොහොමඩ්ව මුණ ගැහිලා එක දවසකට එයාගෙන් ඇතෙක් ඉල්ලා ගත්තා.


මංගල්ලෙ බොහොම ජයට කෙරුණා. මනමාල ජෝඩුව අර ඇතා පිට නැගලා වීදි සංචාරය කළා. කොට්ටුමේලම් සංගීතය නැගෙද්දී නෑදෑයෝ යාළු මිත්‍රයෝ සාන්ත දාන්ත විධියට පෙරහරේ ගියා. ඒත් හදිස්සියෙ ම අර ඇතා බිම ඇදගෙන වැටිලා මැරුණා.

පහුවදා උදේ කුඹල්කාරයා මොහොමඩ් හොයා ගෙන ගියා. ගිහින් සිද්ධ වුණු විපත්තිය විස්තර කළා. "මං කොහොම හරි ඇතාගෙ වටිනාකම ගෙවන්නම්. නැත්නම් වෙන ඇතෙක් අරන් දෙන්නම්" කුඹල්කාරයා මොහොමඩ්ට පොරොන්දු වුණා.

මොහොමඩ්ට කේන්ති ගියා. "මම මගේ ඇතා වෙනුවට කිසි ම දෙයක් බාර ගන්නෙ නෑ. මට මගේ ඇතා ම ආපහු ඕනෑ" මොහොමඩ් කෑ ගැහුවා. ඊට පස්සේ උසාවි ගිහින් කුඹල්කාරයාට විරුද්ධව නඩුවක් දැම්මා.

නඩුකාරයා කුඹල්කාරයා ගෙන්නලා නිදහසට කාරණා ඇහුවා "අනේ නඩුකාර හාමුදුරුවනේ? මේ පැමිණිලිකාරයන්ගෙන් ඉල්ලා ගත්තු ඇතා හදිසියේ මළා. මං

හිතා මතා උඟුව මැරුවෙ නැහැ. මම ඇතාගේ වටිනාකමට සල්ලි දෙන්නට කැමතියි. නැතිනම් වෙන ඇතෙක් අරන් දෙන්ටත් ලෑස්තියි. පැමිණිලිකාරයා ඒ දෙකට ම කැමති නෑ" කියලා කුඹල්කාරයා කෙඳිරි ගෑවා.



නඩුකාරයා මොහොමඩ්ට මෙහෙම කිව්වා. "තමුන්ගෙ ඇතාගෙ මරණය හදිසි මරණයක්. ඒ හින්දා තමුන් කුඹල්කාරයගෙන් ඒ පාඩුවට හරියන මුදලක් ඉල්ලා ගන්නවා. නැත්නම් ඇතෙක් ඉල්ලා ගන්නවා.''

මොහොමඩ් නඩුකාරයගෙ කතාවට කන් දුන්නෙ ම නෑ. තමුන්ගේ ඇතා ම ඉල්ල ඉල්ලා පිංසෙණ්ඩු වුණා. නඩුකාරයා ඒ නඩුව පහුවෙනිදාට කල් දැම්මා. කල්දාලා, කුඹල්කාරයාට පැත්තකට කතා කරලා මෙහෙම කිව්වා. "තමුන් හෙට උසාවි එන්ට ඕනැ නැහැ. මං කියන දේ කරනවා. තමුන්ගේ ගෙයි ඉස්සරහ දොර ළඟ ඇතුළු පැත්තේ හැලි වළං ටිකක් අහුරලා තියනවා. ඊට පස්සෙ දොරේ අගුල නොදමා දෙර වහනවා. මොහොමඩ් උසාවියට ආවා ම තමුන්ව එක්ක ගෙන එන්ට මං මිනිහා ව තමුන්ගේ ගෙදරට එවන්නම්. මිනිහා ඇවිත් දොරට ගහාවි. දොර අරින්ට එපා. මිනිහා කේන්තියටත් එක්ක දොර ඇරගෙන ඇතුළට එයි. එතකොට අර හැළි වළං

බිඳෙයි. තමුන්ට තියෙන්නේ පුළුවන් හයියෙන් විලාප ගහ ගහ අහල පහළ මිනිසුන්ට කියන්න. "අනේ දෙයියනේ මේ මිනිහා මං සීයලා මුත්තලාගේ කාලෙ ඉඳන් ආරස්සා කරපු හැළි වළං ටික බිඳලා දැම්මා" කියලා එතකොට මොහොමඩ් තමුන්ගේ කෑගැහිල්ල නවත්වන්ට හදාවි. අලුත් හැළි වළං අරන් දෙනවයි කියලත් කියාවි. තමුන් මිනිහගේ කතා කනකට ගන්ට එපා. අර හැළි වළං ටික ම ඕනැයි කිය කියා පොළොවේ හැපෙන එකයි ඇත්තේ. ඊට පස්සෙ තමුන් ඇවිත් මට පැමිණිලි කරනවා." නඩුකාරයා මේ විදියට උපදෙස් දීලා කුඹල්කාරයා ව ගෙදර පිටත් කළා.

පහුවදා උදේ මොහොමඩ් උසාවියට ආවා. කුඹල්කාරයා ඇවිත් හිටියෙ නෑ. කුඹල්කාරයා ව එක්ක එන්න නඩුකාරයා මොහොමඩ් ව පිටත් කළා. එතකොට අර කුඹල්කාරයා කෑ ගහගෙන නඩුකාරයා ළඟට ආවා. ඇවිත් විස්තර ඔක්කොම කියලා "මට මගේ පරම්පරාවෙන් අයිති වෙච්ච හැළි වළං ටික කොහොම හරි ආපහු ඕනෑ" කිය කියා උසාවිය දෙවනත් කළා.

"මොනවද තමුන්ට කියන්න තියෙන්නෙ?" නඩුකාරයා මොහොමඩ්ගෙන් ඇහුවා.

"දැන් මට තේරෙනවා" මොහොමඩ් බොහො ම බැගෑපත් විදියට කතාව පටන්ගත්තා. "මට මගේ නැති වෙච්ච ඇතා කොයි තරම් වටිනවා ද ඒ තරමට ම මේ මිනිහට එයාගෙ හැළිවළං ටික වටිනවා ඇති." මොහොමඩ් කිව්වා.

මොහොමඩ්ගේ මොළේ පෑදුණු එක ගැන නඩුකාරයාටත් දැන් සන්තෝෂයි. නඩුකාරයා මොහොමඩ්වත් කුඹල්කාරයාවත් ගෙවල්වලට පිටත් කරලා ඇරියා. පස්සෙ කාලෙකදි කුඹල්කාරයා ඇතාගේ වටිනාකම මොහොමඩ්ට ගෙව්වා. මොහොමඩ් හැළි වළංවල වටිනාකම කුඹල්කාරයාට ගෙව්වා.

## ක්‍රියාකාරකම්

1. පාඩම ශබ්ද නගා කියවන්න.

2. පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. කුඹල්කාරයා මොහොමඩ්ගෙන් ඇතා ඉල්ලා ගත්තේ කුමකට ද?

   ii. පෙරහැරේ යන විට ඇතාට සිදුවූයේ කුමක් ද?

   iii. කුඹල්කාරයා මොහොමඩ් හමු වී සිද්ධිය විස්තර කළ විට මොහොමඩ් කීවේ කුමක් ද?

   iv. මොහොමඩ් අමතා නඩුකාරයා පැවසුවේ කුමක් ද?

   v. නඩුකාරයා කී ආකාරයට කුඹල්කාරයා මෙහොමඩ්ට පැවසුවේ කුමක්ද?

   vi. කුඹල්කාරයාගේ තදබල ඉල්ලීම ගැන මොහොමඩ් පැවසුවේ කුමක් ද?

### භාෂා භාවිතය

1. පහත සඳහන් වචනවල තේරුම් ලියන්න.

   i. ජෝඩු කළා

   ii. සල්ලිය බාගෙ තියන

   iii. ජයට කෙරුණා

   iv. පිංසෙණ්ඩු වුණා

   v. කනකට ගන්න එපා

   vi. පොළොවෙ හැපෙන එකයි

   vii. බැගෑපත්

2. පහත සඳහන් වචනවලට ගැළපෙන සමාන පද පාඩමෙන් තෝරා ලියන්න.

   i. සතුට

   ii. විපත

   iii. අගය

   iv. තරහ

   v. සිරිත් විරිත්

3. පහත සඳහන් වාක්‍යවල අඩංගු ඉරි ඇඳි පදවලට විරුද්ධ පද යොදා නැවත ලියන්න.

i. කුරුල්ලෝ **සෙමින්** පියාඹති.

ii. ගුණපාල **ලෝභී** පුද්ගලයෙකි.

iii. ක්‍රිෂ්ණන් **වේලාසනින්** පාසලට පැමිණියේ ය.

iv. නඩුකාරයා **පැමිණිලිකරු** උසාවියට කැඳවී ය.

v. එය **පැරණි** පොතකි.

4. සුදුසු පරිදි විරාම ලක්ෂණ යොදා පහත සඳහන් ඡේදය ලියන්න.

දිගාමඩුල්ලට පුනර්ජීවනය දුන් ගල් ඔය වැව්ගම්පත්තුව කොටස් දෙකකට බෙදමින් ගලයි නැගෙනහිර පළාතේ මෙයට ගල් ඔය නොව ගල ඔයයි ව්‍යවහාර වෙයි පරණ ලංකා සිතියම්වල මෙය සඳහන් වූයේ පටිපල් ආරු නමිනි එය සෑදී ඇති පට්ට පොළෙයි ආරු යන්නෙහි අදහස ගාල ළඟ ඔය යනුයි එසේ නම් මෙහි මුල් නම ගාලේ ඔය විය යුතු සේ පෙනේ

5. පහත සඳහන් වාක්‍යයන්හි හිස්තැන්වලට වරහන් තුළින් සුදුසු විශේෂණ පද යොදා සම්පූර්ණ කරන්න.

(ලස්සන, ඉදුණු , හොඳ, දක්ෂ, යහපත්)

i. අපි ............................................................................ අඹ කැවෙමු.

ii. ............................................................................ කුරුල්ලා අත්තෙහි වසා සිටී.

iii. ............................................................................ ළමයි ඉක්මනින් උගනිති.

iv. ............................................................................ දරුවා විභාගයෙන් සමත් විය.

............................................................................ මිනිසා අනුන්ට උදවු කළේ ය.

6. පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

i. පරංගියා ....................................... ගියා වගෙයි.
(කෝට්ටේ, මාරපන)

ii. කළුවා ....................................... ගියා වගෙයි.
(කෝට්ටේ, මාරපන)

iii. බල්ලා ....................................... කන්නෙත් නෑ. කන ගොනාට දෙන්නෙත් නෑ.
(පිදුරු, තණකොළ)

7. පාඩමේ ඔබ කැමති කොටසක් ලේඛන බසට හරවා ලියන්න.

8. දී ඇති උදාහරණය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් වාක්‍ය ස්ත්‍රී ලිංගයට හරවා අභ්‍යාස පොතේ ලියන්න.

උදා : පැමිණිලිකාරයා උසාවියට ආවේ ය.

පැමිණිලිකාරිය උසාවියට ආවා ය.

i. ඇතා පෙරහරේ ගමන් කළේ ය.

ii. පියා අමුත්තන් හඳුන්වා දුන්නේ ය.

iii. මනමාලයා සැරසී සිටියේ ය.

iv. පුතා ඉකිගසා හඬන්නට පටන් ගත්තේ ය.

v. ප්‍රාදේශීය ලේකම්තුමා සභාව ඇමතී ය.

9. පහත දක්වෙන වැකිවල හිස්තැන්වලට සුදුසු පද වරහන් තුළින් තෝරා ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

(කැපුවා ය, ඈ, සිත්තරා, වඩුවා, නැටුවා ය)

i. ...................................... චිත්‍රයක් ඇන්දේ ය.

ii. ...................................... පුටුව සෑදුවේ ය.

iii. අම්මා දර ......................................

iv. ...................................... ගමට ගියා ය.

v. ගායිකාව ගයමින් ......................................